**<u>මතුගම ප්‍රාදේශිය කාර්යාලයේ ප්‍රාදේශිය කළමනාකරු නිල නිවසෙහි සුළු අළුත්වැඩියා කටයුතු සඳහා ලංසු කැඳවිම.</u>**

**<u>කොන්ත්‍රාත් අංකය : MP/TSHDA/MATHUGAMA RO / 2024/03</u>**

මෙම අධිකාරියේ,**ප්‍රාදේශිය කාර්යාලය කළුතර,දඩුගොඩයා වත්ත පාර,ඉද්දගොඩ,මතුගම** ලිපිනයෙහි පිහිටි ගොඩනැඟිල්ලෙහි සිදු කළ යුතු සුළු අළුත්වැඩියා කටයුතු සඳහා පහත සඳහන් කොන්දේසි වලට යටත්ව මිල ගණන් කැඳවනු ලැබේ.

ඉංජිනේරු ප්‍රමාණ පත්‍ර හා මිල ගණන් කැඳවීමට අදාල කොන්දේසි ඇතුලත් ලංසු ලේඛණ **2024.12.02** දින සිට **2024.12.09** දින ප.ව. **02.30** දක්වා අංක 70, පාර්ලිමේන්තු පාර පැලවත්ත, බත්තරමුල්ල ලිපිනයෙහි පිහිටි මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ මුදල් අංශයට ආපසු නොගෙවන ලංසු ලේඛණ ගාස්තුව ලෙස **රු:1,500.00**ක මුදලක් ගෙවා මිලදී ගත හැක. **2024.12.10** වන දින ප.ව. **2.30** දක්වා මුද්‍රා තබන ලද ලංසු ලේඛණ ලියාපදිංචි තැපෑලෙන් හෝ ප්‍රධාන කාර්යාලයේ පළමු මහලේ සේවා අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට ගෙනවිත් බහාලීමෙන් ඉදිරිපත් කළ හැකිය.

සෙනසුරාදා, ඉරිදා හා රජයේ නිවාඩු දින හැර සතියේ දින වල අළුත්වැඩියා කල යුතු ඉහත ලිපිනයෙහි සඳහන් පරිශ්‍රය පරීක්ෂා කල හැකි අතර ලංසු ලේඛණ වල සඳහන් කොන්දේසි වලට යටත්ව සියළු මිල ගණන් ඉදිරිපත් කළ යුතුය. මෙම අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට පැමිණ ගෙවීමකින් තොරව ලංසු ලේඛණ පරීක්ෂා කල හැක. කොන්ත්‍රාත් කාර්යය සඳහා මිල ගණන් ඉදිරිපත් කිරීමේදි කොන්ත්‍රාත් ආයතනයට ඉදිකිරීම් සම්බන්ධව අවම **C8 ශ්‍රේණියේ CIDA** ආයතනයේ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.

ලංසු කැඳවීමේ ලේඛණ හා ඉංජිනේරු ප්‍රමාණ පත්‍රය මිල ගණන් කැඳවීමට අදාල කොන්දේසි හා සැලසුම් ආකෘති සහිත ලේඛණ වලින් සමන්විත වේ. ලැබෙන සියළුම ලංසු **2024.12.10** දින ප.ව. **2.30** ට විවෘත කරනු ලැබේ.මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ලංසු සුරක්ෂිතය ලෙස ආපසු ගෙවනු ලබන **රු.15,876.77**ක් වටිනා කොන්දේසි විරහිත බැංකු තැන්පතුවක් ඉදිරිපත් කිරීම හෝ **රු.15,876.77**ක් ක මුදලක් මෙම අධිකාරියේ මුදල් අංශයට ගෙවා එම රිසිට්පත හා දෙවන පිටපත ලංසු ලේඛණ සමග අමුණා එවිය යුතුය. ලංසු සුරක්ෂිතය **2024.12.09** දින වන ලංසු විවෘත කරන දින සිට ඉදිරියට දින 90ක කාලයක් දක්වා වලංගු වනු ඇත.

මිල ගණන් විවෘත කිරීමේදී අදාල මිල ගණන් ඉදිරිපත් කරන ආයතනයේ බලයලත් නිලධාරියෙකුට ඊට සහභාගි විය හැක. මිල ගණන් ඉදිරිපත් කරන ලිපි කවරයේ වම්පස ඉහල කෙලවරෙහි අදාල කොන්ත්‍රාත් අංකය සඳහන් කර එවිය යුතුය. මිල ගණන් ඉදිරිපත් කිරීමේදී අනු පිටපත හා මුල් පිටපත යනුවෙන් සඳහන් පිටපත් දෙකක් ඉදිරිපත් කල යුතුය.මෙම කොත්ත්‍රාත් කාර්යයන් සඳහන් ලැබෙන මිල ගණන් අවලංගු කිරීමේ සම්පූර්ණ බලය ප්‍රසම්පාදන කමිටු සභාපති සතුය.


**සභාපති ,**
**ප්‍රසම්පාදන කමිටුව,**
**කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,**
**අංක 70, පාර්ලිමේන්තු පාර,**
**පැලවත්ත, බත්තරමුල්ල.**

**දුරකථන අංක - 011-7909020**
**011-7909021**